**යාපනය - පොයින්ට් පේද්‍රු මාර්ගය, පුතූර් - මීසාලෙයි මාර්ගය, යාපනය - කන්කසන්තුරෙයි මාර්ගය හා යාපනය - පලාලි මාර්ගයේ කිලෝමීටර් 84 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා වූ උතුරු මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය - 2014**

---

යාපනය - පොයින්ට් පේද්‍රු මාර්ගය, පුතූර් - මීසාලෙයි මාර්ගය, යාපනය - කන්කසන්තුරෙයි මාර්ගය හා යාපනය - පලාලි මාර්ගයේ කිලෝමීටර් 84 ක් පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා වූ උතුරු මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ චීන අපනයන - ආනයන බැංකුව අතර 2010 සැප්තැම්බර් 09 දින එළඹි අංක බීඑල්ඒ 201004 දරන ණය ගිවිසුම ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජාතික මට්ටමින් ව්‍යාපෘති කාර්යයන් කළමනාකරණය හා සම්බන්ධීකරණය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වගකිව යුතුවේ. යාපනය - පොයින්ට් පේද්‍රු මාර්ගය, පුතූර් - මීසාලෙයි මාර්ගය, යාපනය - කන්කසන්තුරෙයි මාර්ගය හා යාපනය - පලාලි මාර්ගයේ කිලෝමීටර් 84 ක් පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ විය. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 88.7 ක් වන අතර ඉන් එජඩො මිලියන 75.4 ක් හෙවත් සියයට 85 ක් මූල්‍යායනය කිරීමට චීන අපනයන - ආනයන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ මූලික කාර්යයන් 2010 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර 2011 ජුනි 09 දින සිට කොන්ත්‍රාත්තුව බලපැවැත්වී තිබුණි. කෙසේ වුවද මාර්ග පුනරුත්ථාපන වැඩ 2013 දෙසැම්බර් 08 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. 2013 ඔක්තෝබර් 01 දින මාර්ග වැඩ නිම කර මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණි. කෙසේ වුවද 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

-------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

------------------------------------------

**2.2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-------------------------------------------------

මාගේ පෙර විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා පිළියම් ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී ද අඛණ්ඩව සිදු කර තිබුණි.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තියට පටහැනිව එකතුව රු.මිලියන 882.65 ක් වූ තාවකාලික මුදල් හා අසම්භාව්‍යයන් සඳහා වෙන්කිරීම් ඇතුළත් මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 30 ක් මත රු.මිලියන 3,055.5 ක් වූ වැඩ පූර්ව අත්තිකාරම් ගෙවීම.

(ආ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 8.3.9 හා 8.6 වගන්තිවලට පටහැනිව ව්‍යාපෘතියට අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින්ට ප්‍රසාද දීමනා හා වෛද්‍යාධාර මුදල් කරගැනීමේ දීමනා එකතුව රු.111,344 ක් ගෙවීම.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛයට පටහැනිව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දෙන ලද සූත්‍රයක් පදනම් කරගෙන ව්‍යාපෘතියට අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින් සඳහා පාරිශ්‍රමික ගණනය කිරීම. මේ සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව එකතුව රු.මිලියන 12.81 ක පාරිශ්‍රමික 2013 දෙසැම්බර් 31 දක්වා ගෙවා තිබුණි.

### 2.2.2 නොසැසඳූ ශේෂ

--------------------

මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු ණය මුදල් රු.මිලියන 2,805.6 ක් වූ අතර විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පිළියෙල කරන ලද සාරාංශ වාර්තාව අනුව අනුරූපී ශේෂය රු.මිලියන 2,318.43 ක් ලෙස දක්වා තිබුණි. රු.මිලියන 487.17 ක්වූ වෙනස සසඳා නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

------------------------

ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව ව්‍යාපෘතියේ මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා හා 2014 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | උපයෝජනය කළ අරමුදල් | | |
|---|---|---|---|---|---|
| | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට |
| | එජඩො. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එජඩො. (මිලියන) | රු. (මිලියන) |
| චීන අපනයන - ආනයන බැංකුව | 75.40 | 10,185.0 | 2,805.63 | 74.75 | 9,281.87 |
| ශ්‍රීලංර | 13.30 | 1,968.75 | 44.82 | 14.60 | 1,905.55 |
| | **88.70** | **12,153.75** | **2,850.45** | **89.35** | **11,187.42** |

### 3.2 භෞතික කාර්යසාධනය

----------------------------

ලැබුණු තොරතුරු අනුව, මාර්ග පුනරුත්ථාපනය කිරීම් හා ප්‍රතිසංස්කරණය කිරීම් සම්පූර්ණයෙන් නිම කර තිබූ අතර පුනරුත්ථාපනය කරන ලද මාර්ග 2013 ඔක්තෝබර් 01 දින මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණි.

**3.3** **කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උපදේශකගේ තත්ත්ව පරීක්ෂණ වාර්තාවලට අනුව, මාර්ග 04 ක අතුරන ලද ඇස්පල්ට් අවශ්‍ය ගුණාත්මක තත්ත්වය සඳහා වූ තාක්ෂණික පිරිවිතරයන්ට අනුකූල වී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් කරන හිමිකම් ඉල්ලීම් වලින් රු.මිලියන 323.04 ක මුදලක් අයකර ගෙන තිබුණි. උපදේශකගේ උපදෙස්වලට අනුව, තාක්ෂණික පිරිවිතරයන්හි සඳහන් කර ඇති තද කිරීම් (compaction) ප්‍රමාණය සියයට 96 සිට සියයට 92 දක්වා අඩුකර තිබුණු අතර අය කර තිබුණු රු.මිලියන 61.84 ක මුදල කොන්ත්‍රාත්කරුට ආපසු ගෙවා තිබුණි. උපදේශක සේවා ගිවිසුමේ විධිවිධානවලට අනුව, එවැනි තීරණ සේවාදායක විසින් ඉංජිනේරුවරයාට ලිඛිතව ලබා දීමෙන් හැර පිරිවිතරයන් වෙනස් කිරීමට උපදේශකට අවසරයක් නොමැත. කෙසේ වුවද පිරිවිතරයන් වෙනස් කිරීම හා ආපසු ගෙවීම් අනුමත කිරීම සඳහා උපදේශකගෙන් හේතු පැහැදිලි කිරීමක් ලබා ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සිවිල් වැඩ නිම කිරීමේදී රු.මිලියන 3,484 ක් වටිනා අතිරේක වැඩ සඳහා රු.මිලියන 2,053 ක්වූ ඉතිරි කිරීම් වාර්තා වී තිබූ අතර ඒ අනුව, විධිමත් බිම් සමීක්ෂණ සිදු කිරීමෙන් හා තථ්‍ය අවශ්‍යතාවය ලබා ගැනීමෙන් තොරව ව්‍යාපෘතිය විසින් ප්‍රමාණ පත්‍ර පිළියෙල කර ඇති බව ඉන් පෙනී යයි. මාර්ග 4 ක දෙපස වීථි ලාම්පු 723 ක් සවි කිරීම සඳහා අදාළ වැඩ ප්‍රමාණ පත්‍රවල ඇතුළත් කර තිබූ නමුත් කේබල් සවිකිරීම සහ වීථි ලාම්පු සඳහා විදුලි බල සම්බන්ධතාවය සැපයීම නොසලකා හැර තිබුණි. එබැවින් රු.මිලියන 41.90 ක විචලන නියෝගයන් අනුමත කිරීමට සිදු වී තිබුණි.

**3.4** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිම කිරීම් ප්‍රකාශනයට අනුව, දේපල කඩා ඉවත් කිරීම හා යළි ගොඩනැඟීම සඳහා ප්‍රමාණ පත්‍රවල රු.මිලියන 15 ක තාවකාලික වෙන්කිරීම් පමණක් කර තිබුණද එම කාර්යය සඳහා රු.මිලියන 515.46 ක මුදලක් ගෙවා තිබුණි. තවද දේපල කඩා ඉවත් කිරීම් හා යළි ගොඩනැගීම් කාර්යයන් සඳහා කොන්ත්‍රාත්කරුවන් සෘජුවම සම්බන්ධ වී නොතිබූ බවත් ගෙවීම් තුන්වන පාර්ශවයන්ට කරන ලද බවත් නිරීක්ෂණය විය. කෙසේ වුවද ගෙවීම් විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පහත සඳහන් කාර්යයන් ව්‍යාපෘතියේ මුල් වැඩ විෂය පථයට සෘජුවම අදාළ නොවුවද, විචලන නියෝගයන් මඟින් එම කාර්යයන් ව්‍යාපෘතිය විසින් සිදු කර තිබුණි.

| **විස්තරය** | **වැය කළ මුදල** |
|---|---|
| | රු.මිලියන |
| යාපනය කොටුවට සහ දුරෙයප්පා ක්‍රීඩා සංකීර්ණයට ප්‍රවේශ මාර්ග ඉදිකිරීම | 39.49 |
| යාපනයේ රෝහල් මංසන්ධියෙහි සංඥා ආලෝක පද්ධතිය | 5.32 |
| කිලිනොච්චි නගරයේ විශේෂිත කාර්යයන් | 63.38 |